# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 8,606—1940ක්වූ අප්‍රේල් මස 26 වෙනි දිනවූ සිකුරාදා.

## Part IV.—හතරවෙනි කාණ්ඩය.

### උපාධ්‍ය නීති.

L. D.—B 269/31

වන්දනා ගමන් පිළිබඳ ආඥාපණතයි.

කතරගම ඇසල උත්සවය සම්බන්ධ නියෝග.

"වන්දනා ගමන් පිළිබඳ ආඥාපණතේ" යයි නම්කරණලද ආඥාපණතේ (133වෙනි පරිච්ඡේදය) 2 වන වගන්තියෙන් බලයලත් ප්‍රකාර 1940 ජූලයි මස පටන්ගණුලබන ඇසල උත්සවය සම්බන්ධ සිරිත් පරිදි කතරගමට කෙරෙන වන්දනා ගමණ් අරඹුණුකොට මෙහි පහත දක්වෙන නියෝග මෙම දන්වීම මගින් ලංකාණ්ඩුකාර උතුමාණන්වහන්සේ වන ඇන්ඩෲ කොල්ඩිකට් නමැති මවිසින් පණවනලදී.

ඒ. කොල්ඩිකට්,
ලංකාණ්ඩුකාර උතුමාණන්වහන්සේ.

1940 ක්වූ අප්‍රේල් මස 17වෙනි දින
නුවරඑළියේදීය.

---

නියෝග.

1. මේ නියෝග සඳහා "වාඩිය" යයි සලකනු ලබන්නේ:—

(අ) කතරගම මහදේවාලයේ සිට සෑමදෙසින්ම හැතැප්ම භාගයක් ඇතුළත ප්‍රදේශය; හා

(ආ) සෙල්ල කතරගම පිහිටි පිල්ලයාර් කෝවිලේ සිට හැතැප්ම කාලක් ඇතුළත ප්‍රදේශයද වේ.

2. (අ) කතරගම ඇසල උත්සවය හා කතරගම වන්දනාකාරයින්ගේ නැවතීම පිළිබඳ කාලය වන 1940 ජූලයි මස 5 වන දින පටන් එම මස 19 වන දින අවසානය දක්වා දවස් 15ක් සීමාකළයුතු බැවින් එය මෙයින් මෙසේ සීමාකරණු ලැබේ.

(ආ) කිසිම වන්දනාකරුවෙක් ජූලයි මස 5වෙනි දිනට පෙර වාඩියට පැමිණීමද එම මස 19වෙනි දිනට පසු වාඩියේ නැවතීමද නොකළ යුතුයි.

3. මෙම වාඩියේ කටයුතු ඌවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගේ සාමාන්‍ය පරිපාලනය පිට හා වෛද්‍ය මූලාදෘනි කෙනෙකුගේ සහ පොලිස් මුලාදෘනියෙකුගේත් ආධාරලත් "ස්ථාන පාලක නිලධාරිතැන" යයි නම්කරණලද මුලාදෘනි කෙනෙකුගේ තීක්ෂණ පරිපාලනය පිටද පවතී.

4. (1) ස්ථාන පාලක නිලධාරිතැනට කතරගමදීද කතරගමට යන එන අතරමගදීද, පහත දක්වෙන නියෝග සැලැස්වීමට බලය තිබේ:—

(අ) සේදීමට හා නෑමටද, වතුර ඇදගන බීමටද, ශරීර කෘත්‍යයන් සඳහාද වන්දනාකාරයින්ගේ විශේෂ ප්‍රයෝජනයට විශේෂ ස්ථාන නියමකිරීමටද;

(ආ) එක් එක් වර්ගයේ වන්දනාකාරයින්ට නැවතීමට ස්ථාන නියමකිරීමටද;

(ඉ) යම්කිසි වන්දනාකාර කාණ්ඩයක් විසින් යායුතු මාර්ග නියමකිරීමටද;

(ඊ) වන්දනාකාරයින්ට දෙන සියලුම ආහාර බෙදදීම හසුරුවීමටද;

(උ) අසනීපවන වන්දනාකාරයින්ගේ ප්‍රයෝජනය පිණිස වාසස්ථාන වෙන්කොට නියමකිරීමටද ඔවුන් සමග ගණුදෙනු කථාබස් තහනම්කිරීමට හා ඔවුන්ට යෑමට නුසුදුසුවන්නම් නවත්වාගැනීමටද බලය තිබේ.

(2) ස්ථාන පාලක නිලධාරිතැන විසින් මෙහි ඉහත 1වෙනි වගන්තියට සඳහන් කටයුතු සම්බන්ධව නීතිප්‍රකාර දෙනු ලබන කිසිම නියෝගයකට කිසිවෙක් අකීකරු නොවිය යුතුයි.

5. ආණ්ඩුවේ ඒජන්තතුමන් විසින් හෝ එතුමන්ගේ අනුමතය පිට හෝ ශරීර කෘත්‍යයන් සඳහා විශේෂයෙන් සලස්වා තිබෙන ස්ථානයක හැර වාඩියේ අන්‍ය ස්ථානයක කිසිවෙකු විසින් මළමූත්‍ර පහකිරීම නොකළ යුතුයි.

6. ආණ්ඩුවේ ඒජන්තතුමන් විසින් හෝ එතුමන්ගේ අනුමතය පිට හෝ කුණු කසල දැමීමට සලස්වා තිබෙන භාජනවල හෝ ඒ වෙනුවෙන් වෙන්කර තිබෙන ස්ථානයක හැර වාඩියේ අන්‍ය කිසිම ස්ථානයක කුණු කසල ආදිය නොදැමිය යුතුයි.

7. ස්ථානපාලක නිලධාරිතැන විසින් ගඟේ නෑමට නියම කරණලද ස්ථානයෙහි හැර ඊට ඉහළින් වාඩියට අයිති සීමාව තුළ කිසිවෙකු විසින් ගඟට බැසීම හෝ නෑම හෝ නොකළ යුතුයි.

8. ස්ථානපාලක නිලධාරිතැනගෙන් අවසරපත්‍රයක් නොලබා නැත්නම් එබඳු අවසරපත්‍ර දීමට එකී නිලධාරි තැනගෙන් බලයලත් යමෙකුගෙන් අවසරපත්‍රයක් නොමැතිව වාඩියේ සිට හැතැප්ම කාලකින් ඇතුළට ගවයෙක් හෝ කරත්ත ගොනෙක් ගෙනඒම නොකළ යුතුයි.

(2) ප්‍රධානතුමාට සුදුසුයයි කල්පනාවන හැටියකින් එවැනි සෑම බල්ලකුම විනාශකිරීම හෝ ඌට වෙනයම් සුදුස්සක් හෝ කළ හැකියි.

7. විකැටි තහඩුවක් හෝ කරපටියක් නිකුත්කර ඇති කවර බල්ලකුගේ වුවත් අයිතිකාරයා විසින්, ඒ බල්ලා සම්බන්ධයෙන් නිකුත්කරනලද ලියාපදිංචිකිරීමේ සහතික පත්‍රය වලංගුව පවත්නා කාලයතුළ සෑම විටෙකම ඒ බල්ලාගේ කරේ ඒ විකැටි තහඩුව හෝ කරපටිය හොඳින් සවිකොට තිබෙන බැව් දක්ඩට, වුවමනා සෑම අන්දමින්ම ක්‍රියාකළ යුතුයි.

8. මේ අතුරු ව්‍යවස්ථාවලින් ප්‍රධානතුමා කෙරෙහි පවරනලද බලවලින් කිසිවක් හෝ සියල්ලම පාවිච්චිකිරීමට ප්‍රධානතුමා විසින් යම් අයකුට ලියවිල්ලකින් බලය පැවරිය හැකියි.

9. අංක 7,627 හා 1928 පෙබරවාරි මස 3 වැනි දින දරන ගැසට් පත්‍රයේ හා අංක 8,270 හා 1937 පෙබරවාරි මස 5 වැනි දින දරන ගැසට් පත්‍රයේ හා අංක 8,419 හා 1938 දෙසැම්බර් මස 9 වැනි දින දරන ගැසට් පත්‍රයෙන් පළවූ බල්ලන් ලියාපදිංචිකිරීම පිළිබඳවූ අතුරු ව්‍යවස්ථා මෙයින් අවලංගුකරනු ලැබේ.

උප ලේඛනය.

පෝර්මය.

අංකය : ——.
ගෙයි අංකය : ————.
වීදිය : ————.
ගමේ නම : ————.
වත්තේ නම : ————.
ගෘහමූලිකයාගේ නම : ————.
————

අංකය : ——.
19—. මාර්තු මස 1 වැනිද හෝ ඊට ප්‍රථමයෙන් සම්පූර්ණකොට පොලිස් ස්ටේෂන් වෙත ආපසු යැවියයුතු වාර්තාවයි.
ගෙයි අංකය : ————.
වීදියේ අංකය : ————.
ගමේ නම : ————.
වත්තේ නම : ————.
ගෘහමූලිකයාගේ නම : ————.

| | තබාගෙන සිටින බල්ලන්ගේ ගණන | විස්තරය | | | | | වෙනත් කරුණු | අයිතිකාරයාගේ නම | ලබන අප්‍රේල් මස 1 වැනිද හෝ ඊට ප්‍රථමයෙන් ගෙවීමේ දිනය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | වර්ග | ගැහැනු සතාද පිරිමි සතාද | පාට | වෙලෙල් මහත | විශේෂ ලක්ෂණ | | | |
| | | | | | | | | | |

භාරදුන් දිනය : 19——.

භාරදුන් දිනය :
19——.

————,
ගෘහමූලිකයාගේ අත්සන.

————,
භාරදෙන අයගේ අත්සන.

නියමිත දිනදී හෝ ඊට ප්‍රථමයෙන් මේ වාර්තාව සම්පූර්ණකොට ආපසු නොයැවීම ගැන අඩුවමක් වශයෙන් රුපියල් 20කට වැඩිනැති දඩයක් ගැසිය හැකියි.

---

M. L. A.—B 1441
L. D.—B 177/36

බල්ලන් ලියාපදිංචිකිරීමේ ආඥාපනත.

ජප්නේ නගරබද සභාවේ පාලන බලය පවත්නා සීමා ඇතුළත ප්‍රදේශයට බල්ලන් ලියාපදිංචිකිරීමේ ආඥාපනතේ (334 වැනි පරිච්ඡේදය) 4 වැනි වගන්තිය යටතේ අතුරු ව්‍යවස්ථා සම්පාදනයකිරීමට බලයලත් නියම නිලධාරීතැන විසින් එනම්, ජප්නේ නගරබද සභාවේ ප්‍රධානතුමා විසින් එකී ප්‍රදේශය වෙනුවෙන් සම්පාදිත අතුරු ව්‍යවස්ථා.

සී. පොන්නම්බලම්,
ප්‍රධානතැන.

1940 අප්‍රේල් මස 22 වැනි දින ජප්නේ නගරබද සභාවේ කාර්‍යාලයේදීය.

අතුරු ව්‍යවස්ථා.

1. මේ අතුරු ව්‍යවස්ථාවල—

"ප්‍රධානතුමා" යනුවෙන් ජප්නේ නගර සභාවේ ප්‍රධානතුමාද;

"අවුරුදුපතා ලියාපදිංචිකිරීමේ ගාස්තුව" යනුවෙන් ආඥාපනතේ 4 වැනි වගන්තිය යටතේ අයකළයුතු අවුරුදුපතා ලියාපදිංචිකිරීමේ ගාස්තුවද;

බල්ලකු සම්බන්ධයෙන් "අයිතිකාරයා" යනුවෙන් ඒ බල්ලා භාරව හෝ අයිතිකරගෙන හෝ සිටින අයද;

අදහස්කරනු ලැබේ.

2. (1) වයස 6 මසකට වැඩිවූ යම් බල්ලකු තබාගෙන සිටින ගෙයක හෝ ස්ථානයක පදිංචිකාරයා විසින් එක් එක් අවුරුද්දේ මාර්තු මස 1 වැනිද හෝ ඊට ප්‍රථමයෙන් ප්‍රධානතුමා වෙත මීට යාකොට ඇති උප ලේඛනයේ තිබෙන පෝර්මයේ ප්‍රකාර වාර්තාවක් සැපයිය යුතුයි.

(2) යම් අවුරුද්දක මාර්තු මස 1 වැනිදසින් පසු යම් අයකු විසින් යම් ගෙයක හෝ ස්ථානයක බල්ලකු තබාගැනීමට පටන්ගත්විට ඒ ගෙයි හෝ ස්ථානයේ පදිංචිකාරයා විසින් ප්‍රධානතුමා වෙත මීට යාකොට ඇති උප ලේඛනයේ තිබෙන පෝර්මයේ ප්‍රකාර වැඩිපුර වාර්තාවක් වහාම සැපයිය යුතුයි.

3. එක් එක් බල්ලාගේ අයිතිකාරයා විසින් අවුරුදුපතා ලියාපදිංචිකිරීමේ ගාස්තුව—

(a) 2 (1) වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ වාර්තාවක් සපයනලද බල්ලකු සම්බන්ධයෙන්වූවිට ගාස්තුව අයවියයුතු අවුරුද්දේ අප්‍රේල් මස 1 වැනිද හෝ ඊට ප්‍රථමයෙන්; හෝ

(b) 2 (2) වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ වැඩිපුර වාර්තාවක් සපයනලද බල්ලකු සම්බන්ධයෙන් වූවිට ඒ වැඩිපුර වාර්තාව සපයනලද දිනයෙහි සිට පසළොස් දිනක් ඇතුළතදී;

ගෙවිය යුතුයි.

4. අවුරුදුපතා ලියාපදිංචිකිරීමේ ගාස්තුව ගෙවූවිට ප්‍රධානතුමා විසින් බල්ලා අයිතිකාරයාට—

(i.) ලියාපදිංචිකිරීමේ සහතිකපත්‍රයක්, හා

(ii.) සහතිකපත්‍රයේ අංකය සහා ඇති විකැටි තහඩුවක් හෝ කරපටියක්,

නිකුත්කළ යුතුයි.

එහෙත් ප්‍රධානතුමා විසින්, ලියාපදිංචිකිරීම් සඳහා ඉල්ලීමක් කළ ඕනෑම බල්ලකු පෙන්නාසිටීමට නියමකිරීමත්,

(a) ඒ බල්ලා පෙන්නා නොසිටියහොත් නම්; හෝ

(b) ප්‍රධානතුමාගේ කල්පනාවේ හැටියට ඒ බල්ලා ජීවත්ව සිටීමට නුසුදුසු ලෙස අංගවිකලවූ හෝ රෝග සහිතවූ හෝ වෙනත් බල්ලන්ට බෝවිය හැකියෙ යම් රෝගයකින් පෙළෙන්නාවූ සතෙක් වේනම්; හෝ

(c) අයිතිකාරයා විසින් ඒ බල්ලාට නිතරම සිරිතක් ලෙස හිංසාකරනු ලැබේනම් නැතහොත් ඌ නොසලකා හරිනු ලැබේ නම්;

ලියාපදිංචිකිරීමේ සහතිකපත්‍රයක් හා විකැටි තහඩුවක් හෝ කරපටියක් ඒ බල්ලා වෙනුවෙන් නිකුත්කිරීම ප්‍රතික්ෂේප කිරීමත්, කළහැකියි.

5. ලියාපදිංචිකිරීමේ සහතිකපත්‍රයක් නිකුත්කර තිබෙන යම් බල්ලකුගේ අයිතිකාරයාගේ පදිංචි ස්ථානයෙහි දැන්වීමක් (නොතීසියක්) තබන්නට හැර ආවාට පසු ප්‍රධානතුමා විසින් ඒ සහතිකපත්‍රය—

(a) ප්‍රධානතුමාගේ කල්පනාවේ හැටියට ඒ බල්ලා ජීවත්ව සිටීමට නුසුදුසු ලෙස අංගවිකලව හෝ රෝග සහිතව සිටීනම්; හෝ

(b) අයිතිකාරයා විසින් ඒ බල්ලාට සිරිතක් ලෙස නිතරම හිංසාකරනු ලැබේනම් නැතහොත් ඌ නොසලකා හරිනු ලැබේනම්; හෝ

(c) ඒ බල්ලා වාතයෙන් හෝ ස්පර්ශයෙන් බෝවන රෝගයකින් පෙළෙමින් සිටියදී අයිතිකාරයා විසින් ඌට වෙනයම් බල්ලකු සමග එකට හැසිරීමට අවකාශ දෙනු ලැබේ නම්; හෝ

(d) ඒ බල්ලා විකැටි තහඩුවක් හෝ කරපටියක් නැතුව දඩාවතේ යන බැව් දකින්නට ලැබේනම්;

අවලංගුකළ හැකියි.

6. (1) 4 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ලියාපදිංචිකිරීමේ සහතිකපත්‍රයක් දීම ප්‍රතික්ෂේපකර ඇත්තාවූ හෝ 5 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ඒ සහතිකපත්‍රය අවලංගුකර ඇත්තාවූ හෝ යම් බල්ලකුගේ අයිතිකාරයා විසින් තමාට ඒ සම්බන්ධයෙන් ප්‍රධානතුමා විසින් දැන්වීමක් (නොතීසියක්) භාරකරවූවිට ඒ දැන්වීමෙහි සඳහන්වන්නාවූ වේලාවේදීත් ස්ථානයේදීත් ඒ බල්ලා ගෙනවුත් පෙන්නාසිටිය යුතුයි.

(2) ප්‍රධානතුමාට සුදුසුයයි කල්පනාවන හැටියකින් එවැනි සෑම බල්ලකුම විනාශකිරීම හෝ ඌට වෙනයම් සුදුස්සක් හෝ කළහැකියි.

7. විකැටි තහඩුවක් හෝ කරපටියක් නිකුත්කර ඇති කවර බල්ලකුගේ වුවත් අයිතිකාරයා විසින් ඒ බල්ලා සම්බන්ධයෙන් නිකුත්කරනලද ලියාපදිංචිකිරීමේ සහතිකපත්‍රය

වලංගුව පවතින කාලයතුළ සෑම විටෙකම ඒ බිල්ලාගේ කරේ ඒ ටිකැට් තහඩුව හෝ කරපටිය නොදින් සවිකොට තිබෙන බැව් දක්මට වුවමනා සෑම අංගමින්ම ක්‍රියාකළ යුතුයි.

8. මේ අතුරු ව්‍යවස්ථාවලින් ප්‍රධානතුමා කෙරෙහි පවරන ලද බලවලින් කිසිවක් හෝ සියල්ලම පාවිච්චිකිරීමට ප්‍රධානතුමා විසින් යම් අයකුට ලියවිල්ලකින් බලය පැවරිය හැකියි.

9. අංක 8,287 හා 1937 අප්‍රේල් මස 30 වැනි දින දරණ ගැසට් පත්‍රයෙහි පළවූ බල්ලන් ලියාපදිංචිකිරීම පිළිබඳවූ අතුරු ව්‍යවස්ථා මෙයින් අවලංගුකරනු ලැබේ.

උප ලේඛනය.

පෝර්මය.

අංකය :——.
ගෙයි අංකය :——.
වීදිය :——.
ගමේ නම :——.
වත්තේ නම :——.
ගෘහමූලිකයාගේ නම :——.

අංකය :——.
19—මාර්තු මස 1 වෙනිදා හෝ ඊට ප්‍රථමයෙන් සම්පූර්ණකොට පොලිස් විදානේ වෙත ආපසු යැවියයුතු වාර්තාවයි.
ගෙයි අංකය :——.
වීදියේ අංකය :——.
ගමේ නම :——.
වත්තේ නම :——.
ගෘහමූලිකයාගේ නම :——.

| තබාගෙන සිටින බල්ලන් ගණන | විස්තරය: බණ්ඩ | විස්තරය: ගෑනුසතා ද පිරිමිසතා ද | විස්තරය: පාට | විස්තරය: බෙල්ලේ බැඳි ලේබලය | වෙනත් කරුණු | අයිතිකාරයාගේ නම | ලබන අප්‍රේල් මස 1 වැනිදා හෝ ඊට ප්‍රථමයෙන් ගෙවීමේ දිනය |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

භාරදුන් දිනය : 19——.

භාරදුන් දිනය : 19——.

——.
ගෘහමූලිකයාගේ අත්සන.

——,
භාරදෙන අයගේ අත්සන.

නියමිත දිනදී හෝ ඊට ප්‍රථමයෙන් මේ වාර්තාව සම්පූර්ණකොට ආපසු නොයැවීම ගැන දඬුවමක් වශයෙන් රුපියල් 20කට වැඩි නැති දඩයක් ගැසිය හැකියි.

---

## ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම.

**Nuwara Eliya, No. 95.**—මධ්‍යම දිසාවේ නුවරඑළියේ උප ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1940ක්වූ ජූනි මස 10වෙනි දිනවූ සඳුදා උදේ 11ට නුවරඑළියේ කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කර දෙන්ට හොඳහොඳක් වෙන අනුමතියක් තීන්දුකරන්ට යෝජනාවා ඇත. මධ්‍යම දිසාවේ නුවරඑළිය පලාතේ කොත්මලේ කෝරළයේ පිහිටා තිබෙන බිම්කැබලි 3ක්.

මූල් සිතියමේ නො. A 105. ගම—මැතගම. අයිතිකම්කියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | | අන්දම. | මහත, අ. රූ. ප. | | | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | මහකුඹුරේහේන නොහොත් මකුරන්නේහේන | — | .. | තේ (ඒ. ඒ. සුවාරිස් අප්පුහාමි විසින් අල්වාගෙන තිබෙන කොටස) | 1 | 0 | 0 | 110* |
| | අයිතිකමකියන්නා—ආණ්ඩුව සහ එදිරිසූරියආරච්චිගේ සුවාරිස් අප්පුහාමි. | | | | | | | |
| 2 | ජපාලයේහේන .. | — | .. | තේ, කොස් සහ එහසල් තියන වත්ත | 1 | 3 | 20 | 60* |
| | අයිතිකමකියන්නා—ආණ්ඩුව සහ බූත්කෝරලේගෙදර අප්පුහාමි. | | | | | | | |
| 3 | එම .. | — | .. | තේ, කොස් සහ එහසල් තියන වත්ත | 0 | 2 | 5 | 60* |

* ඉඩම් පිළිබඳ නියෝග නො. 383 යටතේ බේරීමට.

මෙම ඉඩම් සම්බන්ධ වැඩිදුර තොරතුරු නුවරඑළියේ උප ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගත හැක.

වර්ෂ 1940ක්වූ අප්‍රේල් මස 23වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදිය.

සී. ඇල්. වික්‍රමසිංහ,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුව.

---

## ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම.

ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—වදුරව, නුග්ගමුව යනාදි ගම්වලට කරත්තපාරක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ව්‍යවස්ථාවේ" 5වෙනි වගන්තියේ කරතිබෙන සංශෝධනවල ප්‍රකාරයට පලාත් ආණ්ඩුකාරක මන්ත්‍රණ සභාවට උතුමාණන්වහන්සේගෙන් පැවරී තිබෙන බලය පිට නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම් නම්:—

සිතියමේ නො. A 961. ගම—වදුරව සහ නුග්ගමුව.

| නො. | ඉඩමේ නම. | | අන්දම. | අයිතිකම්කියන්නා. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|---|
| 78 | පාර | .. | අවුරුදු 30–35 වයස පොල්ගස් 6ක් සහ ගොරකගහක්ද ඇති පාර | ගොඩගම්පොලදේවිගේ ප්‍රන්සිස්, කුරුඹඩදේවිගේ යහෝ සහ වීකානපතිරූන්නැලාගේ බුම්පිඅප්පු, වදුරව | 0 | 0 | 17·6 |
| 102 | එම | .. | පාර .. .. | වීරකොඩිපතිරූන්නැලාගේ පීටර්සිඤ්ඤෝ, වදුරව .. | 0 | 0 | 2·2 |
| 126 | එම | .. | අවුරුදු 30ක් වයස පොල්ගස් 10ක් සහ අවුරුදු 8ක් වයස කිතුල් ගහක්ද ඇති පාර | අමරසිංහආරච්චිලාගේ ජේන්නෝනා, එම හයිමන් අප්පුහාමි, එම මානිස් අප්පුහාමි, එම චාර්ලිස් සිඤ්ඤෝ, එම පොඩිනෝනා, එම පුංචිහාමි සහ එම සොපිනෝනා, උතුවන්බෝගහවත්ත | 0 | 0 | 31·5 |
| 130 | එම | .. | අවුරුදු 60ක් වයස පොල්ගස් 2ක්ද, අවුරුදු 20ක් වයස පොල්ගස් 1ක්ද, අවුරුදු 5–10 වයස පොල්ගස් 2ක් සහ තේක්ක ගහක් ඇති පාර | අමරසිංහආරච්චිලාගේ ගුනසේකර, එම පොඩිහාමි, එම සරනේලිස් සිඤ්ඤෝ, නිසුන් ආරච්චිලාගේ ලූවිස්සිඤ්ඤෝ, සහ වික්‍රමඅච්චි නිතානලාගේ අන්ගොනෝනා, උතුවන්බෝගහ වත්ත | 0 | 0 | 22·9 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ හැටියට තිබෙන නැතිව මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනාම තමුන්ම හෝ නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1940ක්වූ මැයිමස 24වෙනි දින පෙරවරු 11.30ට වේයන්ගොඩ පරණ තානායමේදී මා ඉදිරියටම පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකමක්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් මෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනක් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1940ක්වූ අප්‍රේල් මස 23වෙනි දින කොළඹ කච්චේරියේදිය.

ඇල්. ඇස්. බී. පෙරේරා,
ආණ්ඩුවේ අතිරේක උප ඒජන්ත වෙනුව.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්බර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—කළුතර දිස්ත්‍රික්කයේ කටුවලගොඩ මිශ්‍ර පාඨශාලාවක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හතරවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් තිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියමේ නො. A 1,099. ගම— හොරවල

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නෝ. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | කටුවලගොඩවත්ත | අවුරුදු 40ක පොල්ගස් 14ක්, අවුරුදු 10ක දෙල්ගහක්, අවුරුදු 5ක පුවක්ගස් 8ක්, අවුරුදු 15–20ක රබර්ගස් 10ක්, අවුරුදු 8ක දෙහිගහක්, ස්ථිර සෙතාල ගොඩනැගිල්ලක්, තාවකාලික කක්කුස්සියක් සහ ගලෙන් බැඳපු ළිඳක් ඇති ඉඩමක් | මහවත්තගේ දොන් සයිමන්, එම අදොනිස් අප්පුහාමි, එම ඇල්බට් සිංඤෝ, එම මෝසිස්, එම ජී. ජයරත්න, වන්නිආරච්චිගේ පොඩිනෝනා, මද්දුමගේ චාර්ලිස්අප්පු, සියල්ලෝම හොරවල (සමයිව) | 0 2 5·6 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනාම තමුන්ම හෝ නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1940ක්වූ මැයි මස 18වෙනි දින පෙරවරු 9යේ කනිසමට කළුපහන (හොරවල) සිංහල මිශ්‍ර පාඨශාලාවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1940ක්වූ අප්‍රේල් මස 22වෙනි දින
කළුතර කච්චේරියේදීය.

එච්. ඊ. තෙන්නකෝන්,
කළුතර ආණ්ඩුවේ අතිරේක උප ඒජන්ත වර්යා.

---

ආණ්ඩුවේ කටයුත්තකට එනම්:—පල්ලේදෙල්තොට ඉස්කෝලයට මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "203වෙනි පරිච්ඡේදයේ ඉඩම්ලබාගැනීමේ ආඥාපත්‍රයේ" පස්වෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට පලාත් පාලක ආණ්ඩුක්‍රම මන්ත්‍රණ සභාවට උතුමාණන්වහන්සේගෙන් තිසිආකාර අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. A 621. ගම—පල්ලේදෙල්තොට.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නෝ. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | තැන්නේගෙදරකුඹුර .. | කුඹුර .. | කුඹපැලවකගේන්ගලවත්තේදෙළුවේගෙදර මාර්ටින් සිරිසේන | 0 0 31·8 |
| 2 | තැන්නේඅස්වැද්දුම .. | එම .. | පල්ලේදෙල්තොට තැන්නේගෙදර පුලිඟුවා .. | 0 0 0 7 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනාම තමුන්ම හෝ නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1940ක්වූ ජූනි මස 6වෙනි දින පස්වරු 4ටේ කනිසමට පල්ලේදෙල්තොට ඉස්කෝලයේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1940ක්වූ අප්‍රේල් මස 22වෙනි දින
මහනුවර කච්චේරියේදීය.

ඩී. ඩබ්ලිව්. බී. බැරන්,
ආණ්ඩුවේ උප ඒජන්ත වර්යා.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්බර 3වෙනි ආඥාපත්‍රයේ හයවෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—තුන්දුව යන ගමේ ස්වභාෂා පාඨශාලාවක් පිහිටුවීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" පස්වෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් තිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියමේ නො. A 756. ගම—තුන්දුව.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නෝ. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | හැකවිටියවත්ත .. | අවුරුදු 5–12ක්වූ දෙල්ගස් 3ක්ද, අවුරුදු 5–25ක්වූ පොල්ගස් 9ක්ද, තාවකාලික වැට්ල්ලක්ද, පොල්අතු සෙවිලිකරනලද කොටසක් තාවකාලිකවූද කොටසක් ස්ථිරද පාඨශාලා ගොඩනැගිල්ලක්ද, ළිඳක්ද තිබේ (දම්මික විද්‍යාලය සහ බිම) | ගජවීරදු ඩී. ධම්සේන බාර් ජේ. ඩී. ප්‍රනාන්දු සහ සමාගම, කොළඹ | 0 0 30·2 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනාම තමුන්ම හෝ නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1940ක්වූ මැයි මස 18වෙනි දින පෙරවරු 11යේ කනිසමට බෙන්තර තානායමේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලා සිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1940ක්වූ අප්‍රේල් මස 17වෙනි දින
ගාල්ලේ කච්චේරියේදීය.

ඩී. ජී. ඇල්. මිසෝ,
ආණ්ඩුවේ උප ඒජන්ත වර්යා.

---

ආණ්ඩුවට ඉඩම්ගැනීමේ පිළිබඳ ආඥාපත්‍රයේ 6වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට එනම්:—කොග්ගල රාජකීය ගගනයාත්‍රා සමුද්‍රයේ උවමනා පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "ඉඩම ලබාගැනීමේ ආඥාපත්‍රයේ" (Cap. 203) පස්වෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගේ අණ පිට පලාත් පාලක කාරක සභාවෙන් තිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. A 773. ගම—මලලගම.

1940ක්වූ මැයි මස 22වෙනි දින.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නෝ. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | රත්මහරගේන, හුගගහකොර වූව හුනගහ අදද්ර කහත් තෙවත්ත | එකී ඉඩමෙහි අවුරුදු 5–30 දක්වා වයසැති පොල්ගස් 153ක්ද, අවුරුදු 25 කොස්ගස් 5ක්ද, අවුරුදු 20ක දෙල්ගහක්ද, අවුරුදු 15ක ගංදෙල්ගහක්ද, අවුරුදු 10 කජුගස් 5ක්ද, අවුරුදු 3–5 දක්වා පුවක්ගස් 10ක්ද, අවුරුදු 5ක පැණිදොඩම් ගහක්ද, බැම්මෙන් තහා උලුසෙවිලිකරනලද ගෙයක්ද, බැම්මෙන් තහා පොල්අතු සෙවිලි කරනලද ගෙයක්ද අඩංගුවේ | ගලාගමගේවාගේ බබානිස්, මලලගම | 1 2 18·3 |

| අංක. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකම්කියන්නා. | මහන, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 2 | රත්මහරගේන . | අවුරුදු 4ක පොල්ගසක්ද, අවුරුදු 15 කොස් ගසක්ද, අවුරුදු 10 පුවක්ගස් 50ක්ද, අවුරුදු 8 දෙහිගස් 2ක්ද, අවුරුදු 5 නාරංගස් 3ක්ද, අවුරුදු 5 පැණිදොඩම්ගසක්ද, අවුරුදු 15 කජු ගසක්ද, අවුරුදු 3ක දෙලුම්ගසක්ද, අවුරුදු 6 බෙලිගස් 3ක්ද, අවුරුදු 25 කොරකහගස් 3ක්ද, තාවකාලික ගොඩනැගිල්ලක්ද අඩංගුවේ | කොඩගොඩරදුගෙයි සිඤ්ඤබබා, මලලගම | 0 1 20·3 |
| 3 | එම .. | අවුරුදු 40 පොල්ගස් 29ක්ද, අවුරුදු 25 කොස් ගස් 4ක්ද, අවුරුදු 40 අඹගස් 3ක්ද, අවුරුදු 15 දෙහිගසක්ද, අවුරුදු 15 පුවක්ගස් 39ක්ද අඩංගුවේ | පොරඹෙකනත්තෙ හපුආච්චිගේ වාගේ කරොලින්චිනා, මලලගම | 0 2 3·4 |
| 4 | කජුගහවත්ත .. | අවුරුදු 40 පොල්ගස් 28ක්ද, අවුරුදු 5 පොල්ගස් 71ක්ද, අවුරුදු 20 කොස්ගස් 4ක්ද, අවුරුදු 10 පුවක්ගස් 30ක්ද, අවුරුදු 10 දෙහිගසක්ද, අවුරුදු 10 දෙල්ගසක්ද, අවුරුදු 25 ගන්දෙල් ගස් 2ක්ද, අවුරුදු 25 කජුගසක්ද, තාවකාලික ගොඩනැගිල්ලක්ද අංගුවේ | ඇල්. එච්. ලයිරිස් සිල්වා මලලගම | 0 2 37·7 |
| 6 | වැලිගමයවත්ත | අවුරුදු 5–40 දක්වා පොල්ගස් 83ක්ද, අවුරුදු 15 පුවක්ගස් 31ක්ද, අවුරුදු 10–30 දක්වා දෙල් ගස් 7ක්ද, අවුරුදු 30 අඹගසක්ද අඩංගුවේ | ඇස්. එච්. තොසිනාහාමි, මලලගම | 0 1 37 |
| 7 | මල්පලාව .. | අවුරුදු 40 පොල්ගස් 6ක්ද, අවුරුදු 40 කොස් ගස් 2ක්ද, අවුරුදු 50 අඹගසක්ද, අවුරුදු 30 දෙල්ගස් 2ක්ද, අවුරුදු 10 පුවක්ගස් 50ක්ද අඩංගුවේ | ඇල්. එච්. සල්මන් සිල්වා, කතලුව | 0 1 6·4 |
| 8 | අඹගහවත්ත .. | අවුරුදු 8 දොඹගස් 2ක්ද, අවුරුදු 30 දෙල්ගසක්ද, අවුරුදු 19 බෙලිගසක්ද, අවුරුදු 8 නාරංගසක්ද අඩංගුවේ | (1) පොරඹකනත්තෙ හපුආච්චිගේ වාගේ කරොලින්චිනා, (2) කෝදගොඩරදුගේ ජේම්ස් සහ කෝදගොඩරදුගෙයි චාර්ලිස්, මලලගම | 0 1 11·6 |
| 9 | දියකලියගහවත්ත | අවුරුදු 40 පොල්ගස් 10ක්ද, අවුරුදු 40 කොස් ගස් 3ක්ද, අවුරුදු 15 කුඹගස් 3ක්ද, අවුරුදු 15 කජුගස් 3ක්ද, අවුරුදු 8 පැණිදොඩම්ගස් 2ක්ද, අවුරුදු 15 දෙල්ගස් 2ක්ද, අවුරුදු 15 සියඹලා ගස් 2ක්ද, අවුරුදු 10 පුවක්ගස් 15ක්ද, බැම්මෙන් තනා උලුසෙවිලිකරනලද ගෙයක් සහ වඩිච්චි ගෙයක්ද අඩංගුවේ | කොඩගොඩරදුගෙයි චාර්ලිස්, මලලගම | 0 1 29·7 |
| 10 | දෙල්ගහවත්ත . | අවුරුදු 5–15 දක්වා පොල්ගස් 77ක්ද, අවුරුදු 8–40 දක්වා කොස්ගස් දෙකක්ද, අවුරුදු 30 බෙලිගසක්ද, අවුරුදු 40 කොස්ගස් 2ක්ද, අවුරුදු 5 කිතුල්ගසක්ද අඩංගුවේ | පොරඹකනත්තෙ හපුආච්චිගේ වාගේ කරොලින්චිනා, මලලගම | 0 1 35·7 |
| 11 | දෙල්ගහවත්ත නොහොත් බයඅද්දරවත්ත | අවුරුදු 10 පොල්ගස් 100ක්ද, අවුරුදු 15 තොට දූලියා ගසක්ද, අවුරුදු 15 සූරියගසක්ද අඩංගුවේ | (1) ඇල්. එච්. සල්මන් සිල්වා, කතලුව, (2) කොඩගොඩරදුගෙයි චාර්ලිස්, (3) කොඩගොඩරදුගෙයි ජයෝරිස්, (4) විජේරත්නපේඩිගෙයි බබුනසිංදෙ, මලලගම | 0 0 33·1 |
| 12 | එම .. | ගනටවැඹුන අවුරුදු 10ක් වයසැති පුවක්ගස් අඩංගුවේ | විජේරත්නපේඩිගේ බබුනසිංදෙ, මලලගම | 0 1 11·3 |
| 13 | බයඅද්දරවත්ත | අවුරුදු 40 කොස්ගසක්ද, අවුරුදු 40 පොල්ගස් 10ක්ද, පොල්අතු සෙවිලිකරනලද වඩිච්චි ගෙයක කොටසක්ද අඩංගුවේ | විජේරත්නපේඩිගෙයි සර්නේලිස්, මලලගම | 0 0 23·3 |
| 14 | එම .. | අවුරුදු 30 පොල්ගස් 6ක්ද, අවුරුදු 2 පොල්ගස් 31ක්ද, අවුරුදු 30 කොස්ගස් 3ක්ද, අවුරුදු 40 දක්වා බෙලිගස් 3ක්ද, අවුරුදු 10 දෙල් ගසක්ද, අවුරුදු 20 අඹගසක්ද, බැම්මෙන් තනා උලුසෙවිලිකරනලද ස්ථාවර ගොඩනැගිල්ලක් හා තාවකාලික පොල්අතු ගොඩනැගිල්ලක්ද, පොල්අතු සෙවිලිකරනලද වඩිච්චි ගොඩනැගිල්ලක කොටසක්ද අඩංගුවේ | විජේරත්නපේඩිගෙයි බබුනසිංදෙ, මලලගම | 0 1 21 |
| 15 | එම .. | පොල්ගස් 7ක් සහ අවුරුදු 40ක දෙල්ගසක්ද අඩංගුවේ | විජේරත්නපේඩිගෙයි බබුනසිංදෙ සහ විජේරත්නපේඩිගෙයි සර්නේලිස් | 0 0 9·2 |
| 16 | එම — | අවුරුදු 40 පොල්ගස් 69ක්ද, අවුරුදු 5–10 පොල් ගස් 116ක්ද, අවුරුදු 30 කොස්ගස් 4ක්ද, අවුරුදු 25 දෙල්ගස් 14ක්ද, අවුරුදු 8 කිතුල්ගස් 8ක්ද, අවුරුදු 10 පුවක්ගස් 130ක්ද, අවුරු 10 බිලිංගස් 2ක්ද, අවුරුදු 3–5 දෙහිගස් 3ක්ද, අවුරුදු 16 කොරකහගස් 2ක්ද, අවුරුදු 30 බෙලි ගස් 3ක්ද, අවුරුදු 5 දෙලුම්ගස් 5ක්ද, බැම්මෙන් තනා උලුසෙවිලිකරනලද ස්ථාවර ගොඩනැගිලි දෙකක් හා තාවකාලික වඩිච්චි ගොඩනැගිලි 2ක්ද අඩංගුවේ | විජේරත්නපේඩිගෙයි සර්නේලිස්, මලලගම | 1 0 28·6 |
| 17 | වැලිගමයවත්ත | අවුරුදු 40 පොල්ගස් 9ක්ද, අවුරුදු 40 දෙල් ගසක්ද, අවුරුදු 5 කිතුල්ගසක්ද, අවුරුදු 50 කොස්ගස් 3ක්ද, අවුරුදු 15 පුවක්ගස් 40ක්ද, අඩංගුවේ | එම .. | 0 1 27·1 |
| 18 | වැලිගමයාවත්ත | අවුරුදු 10 වයසැති පුවක්ගස් අඩංගුවේ .. | ඇල්. ඇම්. ලයිරිස් ද සිල්වා සහ ඩබ්ලිව්. පී. සර්නේලිස්, මලලගම | 0 0 23·6 |
| 19 | එල්පලාව .. | අවුරුදු 5–30 දක්වා පොල්ගස් 32ද, අවුරුදු 12–30 දෙල්ගස් 4ද, අවුරුදු 10 පුවක්ගස් 50ද අඩංගුවේ | ඇල්. එච්. සල්මන් සිල්වා සහ පුංචි හේවාගේ සිනෝරිස් සිල්වා, කතලුව | 0 1 37 |
| 20 | වැලිගමයාවත්ත | අවුරුදු 4–40 පොල්ගස් 49ක්ද, අවුරුදු 30 දෙල් ගස් 8ද, අවුරුදු 6–40 කොස්ගස් 4ද, අවුරුදු 25 අඹගසක්ද, අවුරුදු 30 කොරකහගසක්ද, අවුරුදු 10 පුවක්ගස් 25ද අඩංගුවේ | පොරඹෙකනත්තේ හපුආච්චිගේ වාගේ කරොලින්චිනා, මලලගම | 0 1 3·4 |

| අංක. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකම්කියන්නා. | ඕහක, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| | | 1940ක්වූ මැයි මස 23වෙනි දින. | | | | |
| 21 | මලපලාව .. | අවුරුදු 4–40ක්වූ පොල්ගස් 32ක්ද, අවුරුදු 30ක දෙල්ගස් 4ක්ද, අවුරුදු 10ක පුවක්ගස් 15ක්ද තිබෙන වත්ත | (1) විජේරත්නපේඩිගේ බබුහාමිනේ, (2) එම සරනේලිස්, (3) පෝරඹකනන්කෙ හපුආච්චිගේවාගේ කාරොන්චිනා, මලලගම | 0 | 0 | 36·5 |
| 22 | වැලිගමගාගේ වත්ත | අවුරුදු 4–40ක්වූ පොල්ගස් 44ක්ද, අවුරුදු 10ක්වූ කිතුල්ගස් 4ක්ද, අවුරුදු 30ක දෙල්ගස් 3ක්ද, අවුරුදු 15–20ක්වූ අඹගස් 2ක්ද, අවුරුදු 15ක්වූ ජම්බුගහක්ද, අවුරුදු 15ක්වූ පුවක්ගස් 18ක්ද ස්ථිර බැම් ගොඩනැගිල්ලක්ද තිබේ | පෝරඹකනන්කේ හපුආච්චිගේවාගේ කාරොන්චිනා, මලලගම | 0 | 0 | 38·4 |
| 25 | බෝදුවම්බරදන කුරුදුවත්ත | අවුරුදු 25ක්වූ පොල්ගස් 44ක්ද, අවුරුදු 15–25ක්වූ දෙල්ගස් 2ක්ද, අවුරුදු 10ක්වූ කොස්ගස් 1ක්ද, අවුරුදු 10ක්වූ පුවක්ගස් 4ක්ද බැම් ලිදක්ද තිබෙන වත්ත | කෝදුගොඩරදගේ ජෙනෝරිස්, මලලගම | 0 | 1 | 18·2 |
| 26 | එම .. | අවුරුදු 15–30ක්වූ පොල්ගස් 203ක්ද, අවුරුදු 1ක්වූ පොල්පැල 13ක්ද, අවුරුදු 10ක්වූ පුවක්ගස් 29ක්ද, අවුරුදු 5ක්වූ කොස්ගස් 4ක්ද, අවුරුදු 25ක්වූ අඹගහක්ද තිබෙන වත්ත | ඇල්. එච්. සලමන් සිල්වා, පී. එච්. සරනේලිස්අප්පු, කතළුව | 2 | 3 | 0·5 |
| 27 | ඔයඅද්දරවත්ත | අවුරුදු 30ක්වූ පොල්ගස් 20ක්ද, දෙල්ගස් 2ක්ද, තිබෙන වත්ත | ඇල්. එච්. සලමන් සිල්වා, කතළුව | 0 | 0 | 25 |
| 28 | එම .. | අවුරුදු 30ක්වූ පොල්ගහක් තිබෙන වත්ත .. | ඇල්. එච්. ලයිසිරිස් සිල්වා සහ පී. කේ. එච්. එච්. කරොන්චිනා | 0 | 0 | 19 |
| 29 | කිඹුලඇල වත්ත | අවුරුදු 40ක්වූ පොල්ගස් 49ක්ද, අවුරුදු 4ක්වූ පොල්පැල 13ක්ද, අවුරුදු 10–25ක්වූ කොස්ගස් 5ක්ද, අවුරුදු 30ක්වූ ගොරකගස් 3ක්ද, අවුරුදු 8ක්වූ කිතුල්ගස් 6ක්ද, අවුරුදු 25ක්වූ අඹගස් 2ක්ද, අවුරුදු 40ක්වූ සියඹලාගස් 1ක්ද, අවුරුදු 10ක්වූ ජම්බුගස් 15ක්ද, අවුරුදු 10ක්වූ පුවක්ගස් 100ක්ද, ස්ථිර ගොඩනැගිල්ලක්ද, තාවකාලික ගොඩනැගිල්ලක්ද තිබෙන ඉඩම | කෝදුගොඩරදගේ ජුවන්, මලලගම | 0 | 2 | 32·2 |
| 30 | ඔයඅද්දර වත්ත නොහොත් කිඹුල ඇල වත්ත | අවුරුදු 30ක්වූ පොල්ගස් 80ක්ද, අවුරුදු 15ක්වූ පුවක්ගස් 37ක්ද, අවුරුදු 9–40ක්වූ කොස්ගස් 2ක්ද, අවුරුදු 10ක්වූ බත්මිගහක්ද, අවුරුදු 8ක්වූ කිතුල්ගස් 4ක්ද, අවුරුදු 30ක්වූ දෙල්ගස් 4ක්ද අවුරුදු 15ක්වූ අඹගස් 2ක්ද තිබෙන වත්ත | බී. ජුවන් සිල්වා, මලලගම .. | 1 | 1 | 13·9 |
| 31 | කිඹුලඇලබොඳුව මරදනවත්ත නොහොත් කිඹුලෙ ඇල ඔවුව | අවුරුදු 5ක්වූ පොල්ගස් 23ක්ද බැම් ලිදක්ද තිබෙන වත්ත | කෝදුගොඩරදගේ ජුවන්, මලලගම | 0 | 0 | 38·2 |
| 32 | කිඹුලඇලබොඳුව මරදනහේවත්ත නොහොත් කිඹුල ඇල ඔවිට | අවුරුදු 5ක්වූ පොල්ගසක්ද, තාවකාලික ගොඩනැගිල්ලක්ද තිබේ | විජේරත්නපේඩිගේ සරනේලිස් .. | 0 | 1 | 32·5 |
| 33 | කිඹුලඇල ඔවිට | අවුරුදු 15–25ක්වූ පොල්ගස් 3ක් තිබෙන ඔවිට සහ හේන | විදනගමගේ ජේම්ස්අප්පු සහ එම අගෝස්තිස්අප්පු, මලලගම | 0 | 3 | 28 |
| 34 | කිඹුලඇල වත්ත | හේන .. .. .. | කේ. ඇස්. පී. තෝනාහාමි, මලලගම | 0 | 0 | 10·3 |
| 35 | බෝදුවම්බරදන වත්ත | අවුරුදු 20 දෙල්ගස් 2 අවුරුදු 25 පොල්ගස් 2ද අඩංගුවේ | ලියනගෙ ජේම්ස් සිල්වා, මලලගම. | 0 | 0 | 7·2 |
| 36 | එම .. | අවුරුදු 40 පොල්ගස් 3ද, අවුරුදු 40 දෙල්ගහක්ද අඩංගුවේ | ඇල්. එච්. ලයිසිරිස් සිල්වා සහ වී. රබෙල්හාමි, මලලගම | 0 | 0 | 31·2 |
| 37 | බෝදරවම්බරදන කුරුන්දෙ වත්ත | අවුරුදු 40 පොල්ගස් 7ද, අවුරුදු 20 කොස්ගසක්ද අඩංගුවේ | විදනගෙයි අගෝරිස් සිල්වා සහ ඇල්. එච්. සාරිස් සිල්වා, මලලගම | 0 | 0 | 25·2 |
| 38 | එම .. | අවුරුදු 40 පොල්ගස් 51ද, අවුරුදු 10 පුවක්ගස් 17ද, අවුරුදු 10 කොස්ගස් 9ද, අවුරුදු 20 දෙල්ගස් 8ද, අවුරුදු 20 අඹගස් 9ද, අවුරුදු 20 සියඹලගසක්ද අඩංගුවේ | ඇල්. එච්. ලයිසිරිස් සිල්වා, මලලගම | 0 | 3 | 0 |
| 39 | එම .. | අවුරුදු 20–40 පොල්ගස් 229ද, අවුරුදු 25 කොස්ගස් 3ද, අවුරුදු 25 කජුගස් 6ක්ද, අවුරුදු 15 පුවක්ගස් 9ක්ද, අවුරුදු 20 අඹගසක්ද, අවුරුදු 4 පැනිදොඩම්ගස් 4ද, අවුරුදු 10 දොඩම්ගස් 3ද, අවුරුදු 25 සියඹලගසක්ද, අවුරුදු 8 නාරංගස් 2ක්ද, අවුරුදු 5 දෙළුම්ගස් 2ක්ද, අවුරුදු 1 පොල්පැල 30ද, බැම්මෙන් තනනලද ගෙවල් 3ද, තාවකාලික ගොඩනැගිලි 2ද, බැම්මෙන් තනනලද ලිදක්ද අඩංගුවේ | නෝර්මන් සිල්වා, කේ. වී. විලියම් සිල්වා සහ මැත්‍යූස්, මලලගම | 2 | 3 | 28·7 |
| 40 | එම .. | අවුරුදු 40 පොල්ගස් 52ක් සහ තාවකාලික වරිච්චි ගෙවල් දෙකක්ද අඩංගුවේ | පියදිගමගෙ අබන්චි අප්පුගේ (කොග්ගල පදිංචි) උරුමක්කාර සින්, විදනගෙයි ඇලිස්නෝනා දෙවුන්දර සහ විදනගෙයි නෝනාහාමි, මලලගම | 0 | 3 | 19·8 |
| 41 | බොබුවමරදන කුරුදුවත්ත | අවුරුදු 40ක්වූ පොල්ගසක්ද, අවුරුදු 20ක්වූ කජ්ජුගසක්ද ස්ථිර ගොඩනැගිල්ලක්ද, තාවකාලික ගොඩනැගිල්ලක්ද තිබෙන වත්ත | ලමාහේවාගේ දිනෝරිස් සිල්වා සහ මානිකුබඩතුරගේ ජන්ගෝනාමි, මලලගම | 1 | 3 | 35·3 |
| 42 | එම .. | අවුරුදු 20ක්වූ කුරුඳු තිබේ .. .. | ලමාහේවාගේ සලමන් සිල්වා .. | 0 | 2 | 24·6 |
| 43 | කිඹුල ඇල මරදන | එම .. .. | මාතරගේ දියෝනිස් සිල්වා, කතළුව | 0 | 3 | 15·6 |

| අං. | ඉඩමේ නම. | විස්තරය. | අයිතිකාරයින්හා. | ප්‍රමාණ, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 44 | කිඹුලඇලමරඳන | අවුරුදු 40ක කුරුඳුද, අවුරුදු 6–40ක්වූ පොල් ගස් 177ක්ද, අවුරුදු 20ක්වූ ගොඩපරද, ගොරක ගසක්ද, අවුරුදු 5–30ක්වූ අඹගස් 2ක්ද, තාවකාලික ගොඩනැගිල්ලක්ද තිබෙන වත්ත | පුංචිහේවාගේ මැන්දිස් සිල්වා, හම්බන්තොට | 5 | 2 | 14·2 |
| 45 | කිඹුලඇලබෝදුවමරඳන කුරුඳුවත්ත | අවුරුදු 40ක්වූ පොල්ගස් 62ක් තිබෙන වත්ත .. | ජී. පී. එච්. ප්‍රේමවංශ, කතළුව, විදනගේ ඇලිස්නෝනා, දෙවුන්දර | 0 | 2 | 21 |
| 46 | එම .. | අවුරුදු 40ක්වූ පොල්ගස් 106ක්ද, අවුරුදු 15–40ක්වූ දෙල්ගස් 2ක්ද, අවුරුදු 50ක්වූ අඹගහක්ද, ස්ථිර ගොඩනැගිල්ලක්ද, වැසිකිළියක්ද, බැමි ලිඳක්ද, සෙක්කුවක්ද තිබෙන වත්ත | පී. එච්. මැන්දිස් සිල්වා, කතළුව, ඩී. ඇම්. සමරවීර මහත්මි, වැලිගම | 1 | 1 | 1 |
| | | 1940ක්වූ මැයි මස 27වෙනි දින. | | | | |
| 47 | කුරුඳුවත්ත .. | අවුරුදු 2–40ක්වූ පොල්ගස් 98ක්ද, අවුරුදු 10ක්වූ කජ්ජුගස් 7ක්ද, අවුරුදු 20ක්වූ ගස්දෙල් ගහක්ද සහ තාවකාලික වඩිච්චි ගොඩනැගිලි දෙකක්ද තිබේ | ජී. ජී. අල්විස් සිල්වා, මලලගම .. | 0 | 2 | 21·3 |
| 48 | එම .. | අවුරුදු 40ක්වූ පොල්ගස් 9ක්ද, අවුරුදු 1ක්වූ පොල්පැලයක්ද, අවුරුදු 10ක්වූ කජ්ජුගහක්ද තිබේ | මරක්කලගේ කරෝලිස්, මලලගම | 0 | 0 | 23·7 |
| 49 | එම .. | අවුරුදු 3–40ක්වූ පොල්ගස් 19ක්ද, අවුරුදු 10ක්වූ කජ්ජුගහක්ද තිබේ | ඇස්. එච්. විලියම් සිල්වා, මලලගම, ඩබ්ලිව්. ඇම්. විලියම් සිල්වා, සාවුකුරුන්ද | 0 | 1 | 3·5 |
| 50 | වැලිකොරටුව .. | අවුරුදු 40ක්වූ පොල්ගස් 7ක්ද, අවුරුදු 30ක්වූ කුරුඳුගහක්ද, අවුරුදු 15ක්වූ කජ්ජුගහක්ද, අවුරුදු 3–6ක්වූ කිතුල්ගස් 2ක්ද, අවුරුදු 10ක්වූ පුවක්ගස් 5ක්ද තිබේ | පුංචිහේවාගේබබුන්හාමි, එම නෝනහාමි, එම පුංචිඅප්පු, එම බබිනෝනා, එම පුංචිනෝනා, එම නෝනහාමි, විදනෙගමගේ ඇලිස්නෝනා, එම විලියම්, පියදිගමගේ පොඩිනෝනා, එම නිකුලස්අප්පු, එම සරලිස්අප්පු, එම සිමන්අප්පු, මලලගම | 0 | 0 | 27·9 |
| 51 | දඹමලවත්ත .. | අවුරුදු 40 පොල්ගස් 15ද, අවුරුදු 30 දෙල්ගස් 4ද, අවුරුදු 8 දෙඹගස් 5ද, අවුරුදු 3–5 කිතුල් ගස් 2, අවුරුදු 25 අඹගස් 2ද, අවුරුදු 6 කොස් ගහක්ද, අවුරුදු 15 පුවක්ගස් 20ද, අවුරුදු 10 දවටගහක්ද, අවුරුදු 5 දෙල්ගස් 2ද, සෙක්කුවක්ද අඩංගුවේ | මුලත්ගෙ ජෝජ් සිල්වා, එම අජ්ලින්විනෝනා, ගමගෙ සාරිස් සිල්වා, ගමගෙ පෙන්ටිස් සිල්වා, ගමගෙ පීරිස් සිල්වා, ගමගෙ ඩේවිත්අප්පු, ගමගෙ කාර්ලිනාහාමි, මුනිවීරතන්ත්‍රිගෙයි පුංචිසිඤ්ඤෝ සහ ඇම්. බී. ජන්ගොහාමි, මලලගම | 0 | 1 | 3·6 |
| 52 | මහවිදනගෙවත්ත | අවුරුදු 40 පොල්ගස් 7ද, අවුරුදු 6 කිතුල්ගස් 1ද, අවුරුදු 15 දෙල්ගහක්ද අඩංගුවේ | ඩබ්ලිව්. කාර්ලිනා ෆොන්සේකා, බදුල්ල, ඩබ්ලිව්. ලොකුහාමි, ඩබ්ලිව්. පුංචිනෝනා සහ ඩබ්ලිව්. මිමිවොහාමි, මලලගම | 0 | 0 | 23·9 |
| 53 | එම .. | අවුරුදු 40 පොල්ගස් 65ද, අවුරුදු 8 පොල්ගස් 7ද, අවුරුදු 20 නාගස් 1ද, අවුරුදු 25 අඹ ගහක්ද, අවුරුදු 10 පුවක්ගස් 8ද, පරන තාවකාලික වඩිච්චි ගොඩනැගිල්ලක්ද අඩංගුවේ | පියදිගමගෙයි චාර්ලිස් සිල්වා, එම කරලිනාහාමි, එම සොපිනෝනා, එම ජේන්නෝනා, එම ඔහිබර්ට් සිල්වා, එම ඒබට් සිල්වා, එම ලූසිනෝනා, මලලගම | 0 | 3 | 20·6 |
| 54 | මහකොරටුව .. | අවුරුදු 40 පොල්ගස් 7ද, අවුරුදු 2–15 පොල්ගස් 44ද, අවුරුදු 10 කිතුල්ගස් 1ද, අවුරුදු 8–12 අඹගස් 3ද, අවුරුදු 3 කොස්ගස් 2ද, අවුරුදු 15 පුවක්ගස් 31ද, අවුරුදු 20 ගොරකගස් 1ද, අවුරුදු 30 දෙල්ගහක්ද අඩංගුවේ | විදනගෙයි ජකෝරිස්අප්පු සහ ඇම්. පී. සිඤ්ඤප්පු, මලලගම | 0 | 0 | 39·3 |
| 55 | විදනගෙදෙනියෙ වත්ත | අවුරුදු 40ක්වූ පොල්ගස් 44ක්ද, අවුරුදු 2–10ක්වූ පොල්ගස් 44ක්ද, අවුරුදු 40ක්වූ දෙල්ගස් 2ක්ද, අවුරුදු 3ක්වූ දෙල්ගස් 2ක්ද, අවුරුදු 20ක්වූ කොස්ගහක්ද, අවුරුදු 30ක්වූ අඹගස් 6ක්ද, අවුරුදු 20ක්වූ කෝන්ගහක්ද, අවුරුදු 8ක්වූ දෙඹගහක්ද, අවුරුදු 3ක්වූ දෙඹගස් 2ක්ද, අවුරුදු 8ක්වූ ගොරකගස් 2ක්ද, අවුරුදු දහයක්වූ දවටගහක්ද, අවුරුදු 4ක්වූ කිතුල් ගහක්ද, අවුරුදු 15ක්වූ පුවක්ගස් 10ක් සහ ස්ථිර ගොඩනැගිලි (බැම්මෙන් කනනලද) 3ක්ද ඇති ඉඩම | විදනගේජකෝරිස්අප්පු, මලලගම විදනගේ මල්ලිස්අප්පු, මලලගම, විදනගේ සිඤ්ඤෝඅප්පු, තංගල්ල, මුනිවීරතන්ත්‍රිගේ තෝමස්අප්පු, මුනිවීරතන්ත්‍රිගේ සයිමන්අප්පු, විදනගමගේ ඇලිස්නෝනා, ගමගේ බබුනෝනා සහ මුනිවීර තන්ත්‍රිගේ ජේන්නෝනා, මලලගම | 0 | 2 | 5·8 |
| 56 | මහවිදනගෙ වත්ත | අවුරුදු 50ක්වූ පොල්ගස් 71ක්ද, අවුරුදු 3–8ක්වූ පොල්ගස් 93ක්ද, අවුරුදු 15ක්වූ පුවක්ගස් 120ක්ද, අවුරුදු 15ක්වූ දෙල්ගස් 13ක්ද, අවුරුදු 5ක්වූ දෙළුම්ගහක්ද, අවුරුදු 50ක්වූ කෝන් ගහක්ද, අවුරුදු 5ක්වූ දෙඹගහක්ද, අවුරුදු 5ක්වූ ජම්බුගස් 8ක්ද, අවුරුදු 5–30ක්වූ ගොරක ගස් 3ක්ද, අවුරුදු 5ක්වූ කිතුල්ගස් 5ක්ද, අවුරුදු 5ක්වූ දෙහිගහක්ද, අවුරුදු 8–15ක්වූ කොස්ගස් 2ක්ද, අවුරුදු 4–25ක්වූ අඹගස් 4ක්ද, අවුරුදු 15ක්වූ වෙරළුගස් 2ක්ද, බැම්මෙන් කනා උළුසෙවිලිකරනලද ස්ථිර ගොඩනැගිලි 2ක් සහ ලිඳක්ද ඇති ඉඩම | විදනගේ ජකෝරිස්අප්පු, විදනගේ නෝනහාමි, පී. ජී. අන්දිරිස්අප්පු, ඇන්. ටී. තෝමස්අප්පු, ඩබ්ලිව්. මල්ලිස්අප්පු, පී. ජී. සරලිස්අප්පු, මෙරෙන්චිගේ ආන්චොහාමි, පී. ජී. තේදියෙස්අප්පු, මලලගම | 1 | 0 | 32·3 |
| 57 | දික්ඔවිට .. | මුඩුබිම .. .. .. | විදනගේ සාමෙල්අප්පු, මලලගම .. | 0 | 0 | 0·2 |
| 58 | එම .. | අවුරුදු 40ක්වූ පොල්ගස් 2ක් ඇති බිමක්ද, අත්හරිනලද වැලිකොරටුවක්වූ බිම්වක්ද | බී. ඒ. ඩබ්ලිව්. ගුණසිංහ, සබරදුව සහ එච්. ආර්. එච්. විලියම් අහන්ගම | 0 | 0 | 35 |
| 60 | එම .. | අවුරුදු 40ක්වූ පොල්ගස් ඇති වත්ත .. | මනිකුබඩතුරගේ පුන්චිනෝනා, කොග්ගල | 1 | 2 | 37·4 |

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 61 | දික්ඔවිට .. | අවුරුදු 40ක්වූ පොල්ගස් 19ක් ඇති වත්ත .. | පියදිගමගේ අන්දිරිස්, මලලගම .. | 0 0 19·2 |
| 62 | එම .. | අවුරුදු 40ක්වූ පොල්ගස් 7ක් ඇති වත්ත .. | විදනගේ ලුවිස්, මලලගම .. | 0 0 8·3 |
| 64 | එම .. | එම .. | ජී. ඊ. එච්. ප්‍රේමවංශ, කහටුව, විදනගේ ඇලිස්නෝනා, දෙවුන්දර | 0 0 6·9 |
| 65 | පුංචිකුරුදුවත්ත | අවුරුදු 3-40ක්වූ පොල්ගස් 21ක්ද, අවුරුදු 10ක්වූ පුවක්ගස් 58ක්ද, අවුරුදු 20ක්වූ බක්මීගස් 2ක්ද, අවුරුදු 20ක්වූ අඹගසක්ද, අවුරුදු 20ක්වූ රුක්අත්තනගසක්ද, අවුරුදු 8ක්වූ ගොරකගස් 3ක් සහ අවුරුදු 5ක්වූ දෙහිගස් 8ක්ද ඇති ඉඩම | ඇම්. සයිමන් සිල්වා, මලලගම .. | 0 1 0·3 |
| 66 | එම .. | අවුරුදු 40ක්වූ පොල්ගස් 19ක්ද, අවුරුදු 15ක්වූ පුවක්ගස් 21ක්ද, අවුරුදු 30ක්වූ දෙල්ගස් 2ක්ද, අවුරුදු 25ක්වූ අඹගසක් සහ තාවකාලික මැටියෙන් සාදනලද ගොඩනැගිල්ලක්ද ඇති ඉඩම | ඇල්. එච්. ඒ. ඇස්. ගුණවර්ධන, රාගල | 0 1 1·6 |
| 67 | එම .. | අවුරුදු 40ක්වූ පොල්ගස් 42ක්ද, අවුරුදු 15ක්වූ පුවක්ගස් 200ක්ද, අවුරුදු 30ක්වූ බක්මීගස් 2ක්ද, අවුරුදු 30ක්වූ දෙල්ගස් 2ක්ද, අවුරුදු 15ක්වූ කොස්ගසක් සහ අවුරුදු 10ක්වූ කිතුල් ගස් 5ක් ඇති ඉඩම | ඇම්. බී. ජංගොනාමි, මලලගම .. | 0 3 1·7 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනාම තමුන්ම හෝ නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය මෙහි පහත සඳහන් එනම්, මැයි මස 22, 23 සහ 27වෙනි දිනවල පෙරවරු 9ගේ කනියමට ගාල්ලේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1940ක්වූ අප්‍රේල් මස 22වෙනි දින ගාල්ලේ කච්චේරියේදීය.

ඇම්. කේ. ඩී. සැන්ඩිස්,
දකුණු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත වර්‍යා.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3ගේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:— ගම්සභාපාරක් කැපීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876ගේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංශාර්තුවල ප්‍රකාරයට පලාත් ආණ්ඩුකාරක මන්ත්‍රී සභාවට උතුමාණන්වහන්සේගෙන් පැවරී තිබෙන බලය පිට නියිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම් නම්:—

උප්පුවාගන්නාලද දෙවෙනි කොටස, අවසාන සිතියමේ නො. 1,526. ගම—වයඹ පලාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැලිඩවිල්ලිහත්පත්තුවේ ගන්නාවේකෝරලේ කහපත්වල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 213 | බන්ඩාරමුත්තෙටුව .. | කුඹුර .. | නුවර දලදා මාලිගාවේ භාරකාරයෝ .. | 1 0 3·1 |
| 214 | ඇල .. | ඇල .. | එම .. | .. 0 0 0·6 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනාම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1940ක්වූ ජූනි මස 17වෙනි දින පෙරවරු 10ගේ කනියමට කුරුණෑගල කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1940ක්වූ අප්‍රේල් මස 17වෙනි දින කුරුණෑගල කච්චේරියේදීය.

ඇම්. ශ්‍රීකාන්තා,
වයඹ පලාතේ ආණ්ඩුවේ උප ඒජන්ත වර්‍යා.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3ගේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:— කොළොන්නේ ඉස්පිරිතාලයට ප්‍රසූතිකාගාරයක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876ගේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංශාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නියිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම් නම්:—

සිතියමේ නො. 257. ගම—කොළොන්නේ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 2 | කෝන්ගස්මුල්ලේවත්ත .. | වත්ත .. | කේ. අප්පුහාමිනයිදේ සහ තවත් අය .. | 0 0 28 |
| 3 | එම .. | එම | එම | 0 0 7 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනාම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අයට ලියවිනකදී වර්ෂ 1940ක්වූ මැයි මස 23වෙනි දින උදේ 10ගේ කනියමට රත්නපුරේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලා සිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1940ක්වූ අප්‍රේල් මස 23වෙනි දින රත්නපුර කච්චේරියේදීය.

ආර්. ඇම්. ඩේවිස්.
සබරගමු පලාතේ ආණ්ඩුවේ මහ ඒජන්ත වර්‍යා.

---

## අන්‍ය දැන්වීම්.

කොළඹ දිස්ත්‍රික්කයේ සියනෑකෝරළයේ මැදපත්තුවේ අලුත්ගම ගම්පහ පදිංචි කුරුප්පුආරච්චිගේ එඩ්වින් ගුණසේන වන මම කොළඹ දිස්ත්‍රික්කය තුළ සිංහල භාෂාවෙන් වැඩකරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනකු හැටියට පත්කරනු ලබන පිණිස මෙවක් පටන් තුන්මාසයක් ගතවූවායින් පසු රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලුම්කරන බව වර්ෂ 1907ගේ අංක 1 දරන ආඥාපනතේ 1B ඇඹුල්පත්‍රයේ 2වෙනි වගන්තියේ ප්‍රකාර මෙයින් දැනුම්දී සිටිමි.

කේ. ඒ. ඊ. ගුණසේන.

බන්ඩාරවත්ත, ගම්පහ.
28 මාර්තු 1940.

මීගමු දිස්ත්‍රික්කයේ අලුත්කුරුකෝරළේ දසියපත්තුවේ විතානමුල්ලේ පදිංචි රත්නායකමුදියන්සෙලාගේ පියසේන වන මම රත්නපුර දිස්ත්‍රික්කය තුළ සිංහල භාෂාවෙන් වැඩකරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනකු හැටියට පත්කරනු ලබන පිණිස මෙවක් පටන් තුන්මාසයක් ගතවූවායින් පසු රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලුම්කරන බව වර්ෂ 1907 අංක 1 දරන ආඥාපණතේ 1B දරන උප ලේඛනයේ 2වෙනි වගන්තියේ ප්‍රකාර මෙයින් දැනුම්දී සිටිමි.

ර. මු. පියසේන.

1940 මාර්තු 28.
විතානමුල්ල-දිවුලපිටිය.

---

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.